**ශීර්ෂය 110 - අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජූලි 19 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූලි 10 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බැලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධි විධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික වියයුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇති වීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

**(ආ)** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ වත්කම් වාර්තාවට අනුව 2018 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා යන්ත්‍ර හා උපකරණ යටතේ මිල දී ගෙන තිබුණු රු.2,210,395 ක් වටිනා කාර්යාල උපකරණ ඒසීඒ - 06 ආකෘතියේ මිල දී ගැනීම් යටතේ දක්වා නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය අවසානයට එහි මුළු වත්කම් වටිනාකම රු.791,491,836 ක් වුවත්, ඒසීඒ - 06 ආකෘතියේ එම වටිනාකම රු.388,219,862 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි. එම නිසා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් වටිනාකම සහ දේපල පිරියත හා උපකරණ සංචිත වටිනාකම රු.403,271,974 කින් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.3 උප වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විගණන විමසුමේ සඳහන් කරුණු පිළිගනිමි. ඉදිරියේ දී එම ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. |
| **(ආ)** චක්‍රලේඛයේ 3.4 උප වගන්තිය අනුව සටහන් අංක **(iii)** යටතේ වන බැඳීම් හා බැරකම් ප්‍රකාශය හා භාණ්ඩාගාරය විසින් නිකුත් කරණු ලබන බැඳීම් හා බැරකම් ප්‍රකාශය එකිනෙකට එකඟ වියයුතු වුවත් ඒවා නොසැසඳුනු අවස්ථා 03 ක් නිරීක්ෂණය විය. | නොසැසඳුනු අවස්ථා නිරවුල් කර මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු වේ. | අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇති සත්‍ය වටිනාකම් පදනම් කරගෙන සටහන (iii) ආකෘතියට වටිනාකම් ඇතුලත් කර ඇති අතර වෙනත් දෙපාර්තමේන්තු විසින් සිගාස් වැඩසටහන හරහා 110 – 01 – 03 – 1409 වැය විෂයට බැඳීම් සහ බැරකම් ඇතුළත් කර ඇත. ඒ අනුව |

| | | |
|---|---|---|
| | | භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද බැදීම් සහ බැරකම් ප්‍රකාශයේ සහ සටහන (iii) වටිනාකම් අතර වෙනසක් පෙන්නුම් කර ඇත. |

**1.6.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** වැඩ තහනමට ලක් වූ නිලධාරීන් තුන් දෙනෙකුගේ ණයශේෂ එකතුව වූ රු.323,197 ක් වසර 06 සිට 11 දක්වා කාල පරාසයක සිට අය වී නොතිබුණි. | ඇපකරුවන්ගෙන් හෝ අය කරගත යුතුවේ. | රු.162,215 ක ණය ශේෂ අය කර ගැනීමට අවශ්‍ය නීතිමය පියවර සඳහා අදාල තොරතුරු නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. අනෙකුත් ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| **(ආ)** සේවය හැර ගිය නිලධාරීන් 05 දෙනෙකුගේ එකතුව වූ රු.318,425 ක ණය ශේෂ වසර 03 සිට වසර 21 දක්වා කාල පරාසයක සිට අය වී නොතිබුණි. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | රු.238,395 ක ණය ශේෂ අය කර ගැනීමට අවශ්‍ය නීතිමය පියවර ගැනීම සඳහා අදාල තොරතුරු නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. අනෙකුත් ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. |

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළහැකි වන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළයුතු වුවත් බැරකම් ලේඛනයක් පවත්වා ගෙනගොස් නොතිබුණි | බැරකම් ලේඛනයක අදාල බැරකම් සටහන් කළයුතු වේ. | විගණන විමසුමේ සඳහන් කරුණු පිළිගනිමි. ඉදිරියේදී බැරකම් ලේඛණයක් යාවත්කාලීනව පවත්වාගෙන යාමට පියවර ගනු ලැබේ. |

### 1.6.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළයුතු සහතික වීම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවක් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික වියයුතු වුවත් වාර්තාවේ 3.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | විගණන විමසුම් වලට අදාල පැරණි ලිපිගොනු පරික්ෂා කර කරුණු අධ්‍යනය කිරීමෙන් අනතුරුව පිළිතුරු සකස් කලයුතු වන බැවින් විගණන විමසුම් වලට පිළිතුරු ලිවීමේ දී කාල පමාවක් සිදුවී ඇත. නමුත් ඉදිරියේ දී නියමිත දිනට විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට පියවර ගන්නා ලෙසට අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී. |

### 1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි | සමාලෝචිත වර්ෂය අවසානයට නිකුත් කරන ලද | මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | අංක 137828 හා 150444 දරන චෙක්පත් සඳහා ආදායකයින් විසින් හානි රක්ෂණ ලිපි |

| | | | |
|---|---|---|---|
| 396 | එහෙත් කල් ඉකුත් වූ රු.164,136 ක් වටිනා චෙක්පත් 17 ක් සම්බන්ධයෙන් නියමිත පරිදි කටයුතු කර නොතිබුණු අතර එයින් 2019 ජුලි වන විට ඉන් අස්ථානගත වී තිබුණු රු.3,510 ක් වටිනා චෙක්පත සම්බන්ධයෙන් ද නියමිත පරිදි කටයුතු කර නොතිබුණි. | | ඉදිරිපත් කර ඇති අතර එම චෙක්පත් සඳහා ගෙවීම් සිදු නොකරන මෙන් බැංකුව වෙත දැනුම් දී ඇත. 161644 දරන චෙක්පත අස්ථානගත වී ඇති බැවින් හානි රක්ෂණ ලිපියක් එවන ලෙස ආදායකයා වෙත දන්වා ඇත. අනෙකුත් චෙක්පත් සියල්ලම මේ වන විට නිශ්කාශනය වී ඇත. |
| **(ii)**මුදල් රෙගුලාසි 571 | 2018 දෙසැම්බර් 31 දින වන විට තැන්පත් කර වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පත්වලින් 2019 ජුලි මස වන විට තවදුරටත් ඉතිරිව පැවති රු.471,246 ක තැන්පත් ශේෂයන් සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | තැන්පත් ගිණුම් අංක 6000 – 0 – 0 – 2 – 0 – 138 සහ 6000 – 0 – 0 – 16 – 0 – 86 දරන රු.37,890 ක තැන්පත් මුදල් මේ වන විට රජයේ ආදායමට බැර කර ඇත. අනෙකුත් තැන්පත් මුදල් අදාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හෝ රජයේ ආදායමට බැර කිරීම සඳහා ඉදිරියේ දී කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>------------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------- |
|---|---|---|
| වැය විෂයයන් 05 ක් යටතේ ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කිරීම සඳහා සලසා ගෙන තිබුණු ශුද්ධ ප්‍රතිපාදන එකතුව වූ රු.8,654,521 ක මුදල සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. තවද එක් මූලධන වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.500,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනය ද සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ඇස්තමේන්තු සකස් කරන්නේ නම් පූර්වකථනය කර ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් අදාල කාලය තුළ ඉටු කිරීමට අමාත්‍යාංශය කටයුතු කළ යුතුවේ. | වාණිජ සමථ කරන පනත සම්මත කරවා ගෙන ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටළු නිසා වාණිජ සමථ කරන මධ්‍යස්ථානයේ ක්‍රියාකාරීත්වයක් නොතිබීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි විය. ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට වගබලා ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වමි. |

## 2.2 තැන්පත් ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| UNDP – **SELAGSI** ව්‍යාපෘතියේ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන සංවිධානය කිරීම සඳහා 2016 ජූනි 02 දින ලැබී තිබූ රු.307,496 ක මුදල සහ 2016 නොවැම්බර් මාසයේ පැවති සමථ දිනය වෙනුවෙන් දරන ලද වියදම් පියවීම සඳහා ලැබී තිබූ රු.1,316,041 ක මුදල වශයෙන් එකතුව රු.1,623,537 ක මුදලක් අදාල කාර්යයන් සඳහා නොයොදා තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | ලැබුණු මුදල් අදාල කාර්යයට යෙදිය යුතුවේ. | විගණන විමසුමේ සඳහන් කරුණු පිළිගනිමි. මෙම මුදල් උපයෝජනය කිරීම පිළිබඳව තවදුරටත් සොයා බලා අවශ්‍යතා හඳුනාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලබන අතර මෙම මුදල් ප්‍රයෝජ්‍යවත් ලෙස උපයෝජනය කර ගැනීමට අනුමැතිය ලබා ගැනීම සඳහා UNDP ව්‍යාපෘතියේ නිලධාරීන් සමඟ සාකච්ඡා කරමින් පවතී. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේ දී වර්ෂයට යාවත්කාලීන කරන ලද ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය, දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තරය, අක් මුදල් සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම යනාදී තොරතුරු ඇතුළත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වේ. | අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කර ඇත. ඉදිරියේ දී විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි අදාල විස්තර ඇතුළත් කර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. |

## 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| අමාත්‍යාංශයේ නව කාර්යාල ගොඩනැගිල්ල සඳහා වායු සමීකරණ පද්ධතියක් සවි කිරීම වෙනුවෙන් 2016 දෙසැම්බර් 13 දින වනවිට වැඩ අවසන් කර භාර දීම සඳහා රු. මිලියන 52.55 ක කොන්ත්‍රාත් වටිනාකමකට ගිවිසුම් ගත වී තිබුණි. එහෙත් රු.මිලියන 14.60 ක්වූ අතිරේක වැඩ ඇස්තමේන්තුව සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ යාන්ත්‍රික ඉංජිනේරු විසින් හේතූන් රාශියක් දක්වා ඒ සඳහා එකඟ වී නොතිබුණි. මෙම කරුණු දැක්වීම පදනම් කර ගෙන ප්‍රසම්පාදන කමිටුවෙහි ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි. තවද 2016 වර්ෂයේ නියමිත දින වනවිට වැඩ නිම නොවූ මෙම ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේ දී වෙන් කර තිබූ රු.මිලියන 21.84 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 6.51 ක් ද, 2018 වර්ෂයේ දී වෙන් කර තිබූ රු.මිලියන 17.5 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 17.43 ක් ද උපයෝජනය කර නොතිබුණි. | | මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පැන නැඟී ඇති තාක්ෂණික ගැටළු විසඳා ගෙන අදාළ අනුමැතිය සඳහා ටෙන්ඩර් මණ්ඩලය වෙත ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කිරීමට නොහැකි වීම මත ප්‍රතිපාදන ඉතිරි වී ඇත. මෙම කාර්යය ඉතා සංකීර්ණ තාක්ෂණික ගැටළුවක් බැවින් ඊට තාක්ෂණික උපදෙස් ලබා ගැනීම සඳහා මේ වන විට අදාළ ක්ෂේත්‍රයේ විශේෂඥ දැනුම ඇති තෙවන පාර්ශවයක් වෙත ඉදිරිපත් කර ඇත. එම වාර්තාව අප වෙත ලැබීමෙන් අනතුරුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 අනුව කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වමි. |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අමාත්‍යාංශයට අයිතිව තිබෙන බත්තරමුල්ලේ ගොඩනැගිල්ල පිහිටි ඉඩම 2018 දෙසැම්බර් 31 දින වන විටත් තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | ගොඩනැගිල්ලේ වටිනාකම තක්සේරු කරගත යුතුවේ. | අමාත්‍යාංශයට අයත් බත්තරමුල්ලේ පිහිටා ඇති ගොඩනැගිල්ල තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ පැවති සාකච්ඡා සඳහාද තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කැඳවා මෙම කටයුත්ත කඩිනම් කරන ලෙස දැනුම් දී ඇත. |
| (ආ) අමාත්‍යාංශයට අයිතිව තිබෙන නුවරඑළිය හා රක්වාන යන සංචාරක බංගලා දෙක පිහිටා ඇති ගොඩනැගිලි දෙක සහ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව පිහිටා ඇති ගොඩනැගිල්ල යන ගොඩනැගිලි තුනට අයත් ඉඩම්වල අයිතිය 2018 දෙසැම්බර් 31 දින වන විටත් තහවුරු කර ගෙන නොතිබුණි. | අමාත්‍යාංශයට අයිති වත්කම් සම්බන්ධයෙන් අයිතිය තහවුරු කරගත යුතුවේ. | රක්වාන සංචාරක බංගලාව අක්කර 01 රූඩ් 01 පර්චස් 10 ක ඉඩම් කොටසක පිහිටා ඇති අතර 2019 ජූනි 24 දින මෙම ඉඩම පවරා දෙන ලෙස අයදුම්පත් ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ඉදිරිපත් කර ඇත.<br>නීති කෙටුම්පත් සම්පාදක ගොඩනැගිල්ල සහ නුවරඑළිය සංචාරක බංගලාවෙහි වටිනාකම් තක්සේරු කිරීම සඳහා ඉඩම් සම්බන්ධ ලේඛන අමාත්‍යාංශය සතුව නොමැති බැවින් එම තොරතුරු ගෙන්වා ගැනීම සඳහා අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලිපි යොමු කර ඇත. |

| | | |
|---|---|---|
| **(ඇ)** කල්බදු ක්‍රමය යටතේ මිල දී ගෙන තිබුණු මෝටර් රථ 23 හි මුළු මුදල 2012 මැයි 27 දින ගෙවා අවසන් කර තිබුණත් 2018 වර්ෂය වන විටත් එම වාහන වල අයිතිය පවරාගෙන නොතිබුණි. මෙයින් වාහන 22 ක් අපහරණය කිරිමට 2018 වර්ෂයේ දී හඳුනාගෙන තිබුණත් අයිතිය නොමැති නිසා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2015 හි 9 (අ) උප වගන්තිය අනුව අපහරණය සඳහා නිර්දේශය ලැබී නොතිබුණි. එමෙන්ම එම වාහන 22 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත ලබා දීමට නොහැකි වී තිබුණේද මුල් ලියාපදිංචිය අමාත්‍යාංශය නමට නොමැති වීම හේතුවෙන් තක්සේරු වටිනාකම ලබා ගැනිමට නොහැකි විම නිසා බව විගණනයේ දී නිරීක්ෂණය විය. | වාහනවල අයිතිය පවරා ගත යුතුවේ. | කල්බදු ක්‍රමය යටතේ මිල දී ගෙන තිබූ මෝටර් වාහනවල අයිතිය පවරා ගැනීම සම්බන්ධයෙන් පවතින ගැටළුකාරී තත්ත්වය මේ වන විටත් විසඳා ගැනීමට නොහැකි වී ඇත. |
| **(ඇ)** කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහන 13 ක් ඇතුළු වාහන 29 ක් විධිමත් පවරාදීමකින් තොරව 2018 වර්ෂයේදී වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත ලබාදී තිබුණි. | විධිමත්ව පවරා දිය යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| **(ඉ)** එක් ඩිෆෙන්ඩර් රථයක් 2017 මාර්තු 08 අනතුරකට පත්වීම සම්බන්ධයෙන් 2017 ජුනි 07 දින පරීක්ෂණ මණ්ඩලයක් පත් කර තිබුණි. ඒ සම්බන්ධ පරික්ෂණ වාර්තාවක් 2018 දෙසැම්බර් දක්වා ඉදිරිපත් කර නොතිබුණු අතර අළුත්වැඩියාව සිදු කළ බවට තොරතුරු හා වාහනය අමාත්‍යාංශ වෙත නැවත ලබා ගත් බවට තොරතුරු විගණනය වෙත ලබා දී නොතිබුණි. | පරීක්ෂණ කඩිනමින් අවසන් කළ යුතුවේ. | - එම - |

| | | |
|---|---|---|
| (ඊ) 2018 වර්ෂයේ සිදු වූ වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. 2017 වර්ෂයේ සිදු වූ වාහන අනතුරු 16 ක් වෙනුවෙන් 2018 පෙබරවාරි 28 දින පරීක්ෂණ මණ්ඩලයක් පත් කර තිබූ නමුත් 2018 නොවැම්බර් මස දක්වාම ඊට අදාල පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 අනුව කටයුතු කළ යුතුවේ. | - එම - |
| (උ) ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තා කිරීමේදී සෑම වර්ගයකම වත්කම්වල භෞතික ප්‍රමාණය, ස්ථාවර වත්කම්වල ලෙජරය අනුව වටිනාකම් හා පාලන ගිණුම් අනුව වටිනාකම් යනාදිය සැසඳීම් කර ඒවායේ නිවැරදිතාවය තහවුරු කරගෙන නොතිබුණි. | අදාල සැසඳීම් නිවැරදිව සිදුකර නිවැරදිතාවය තහවුරු කරගත යුතුවේ. | විගණන විමසුම මඟින් පෙන්වා දී ඇති පරිදි ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීමේ පවතින අඩුපාඩු මඟ හරවාගෙන ඉදිරියේද නිසි පරිදි කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. |

## 3.4 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය ස්ථිර ස්ථානයක ස්ථාපිත කරන තෙක් කුලියට ගත් ස්ථානයක පවත්වාගෙන යාම වෙනුවෙන් 2018 වර්ෂය සඳහා රු.මිලියන 34.85 ක් ගෙවා තිබුණි. මෙම මධ්‍යස්ථානය 2016 දෙසැම්බර් මාසයේ දී ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ස්ථාපිත කර ඇතත් සමාගමට අවශ්‍ය මූලධනය සපයා දීම සම්බන්ධයෙන් තීරණයක් ගෙන නොමැති වීම හා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර නොමැති වීම යන හේතු නිසා එම සමාගම අක්‍රියව පවතින බව ලිපිගොනු අනුව නිරීක්ෂණය විය. මේ අනුව 2013 වර්ෂයේ සිට වසර 5 ½ ක් ගත වී තිබුණත් මෙම මධ්‍යස්ථානය ස්ථිර ස්ථානයක පිහිටුවීමට අධිකරණ | මෙම පරිපාලන ගැටළු කඩිනමින් නිරාකරණය කර ගැනීමටත් මුදල් අරපිරිමැස්මෙන් උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතු වීම. | ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා සුදුසු ස්ථානයක් මේ වන තෙක් සොයා ගැනීමට නොහැකි වූ බව දන්වමි. මෙම සමාගමට අවශ්‍ය මූලධනය සහ මෙහෙයුම් ස්වාධීනත්වය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති ඉල්ලීම පිළිබඳව නිර්දේශ ලබා ගැනීමට ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව විසින් 2017 නොවැම්බර් 29 දින විශේෂ කමිටුවක් පත්කොට, එම නිර්දේශ ලබා ගැනීම සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු |

| | | |
|---|---|---|
| අමාත්‍යාංශය අපොහොසත් වී ඇති අතර පිහිටුවන ලද සමාගම ද අක්‍රීය වීම නිසා ගෙවන ලද රු.මිලියන34.85 ක කුලිය අනාර්ථික ගනුදෙනුවක් බව නිරීක්ෂණය කෙරේ. | | අමාත්‍යාංශය හා නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයන් වෙත පැවරීමට තීරණය කොට ඇත.<br>ඉහත ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවේ 2017 නොවැම්බර් 29 දිනැති තීරණය 2017 දෙසැම්බර් 12 දිනදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර, එකී විශේෂ කමිටුව විසින් ලබාදෙනු ලබන නිර්දේශ අධිකරණ අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයන් ලෙස ඉදිරිපත් කරනු ලැබිය යුතු බවට අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇති නමුත් මෙතෙක් මෙම අමාත්‍යාංශය වෙත එම නිර්දේශ ලබාදීම පිළිබඳව දැනුවත් වී නොමැත.<br>ඒ අනුව ප්‍රධාන වශයෙන් මෙම සමාගමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම පිළිබව අවසාන නිගමනයකට පැමිණ නොමැති බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය අක්‍රීයව පවතින බව දන්වා සිටිමි. |

## 3.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂය වෙනුවෙන් නිකුත් කරන ලද එක් විගණන විමසුමකට ද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් නිකුත් කරන ලද විගණන විමසුම් 04 කට ද පිළිතුරු 2019 ජූලි 31 දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 155 හා 452(1) හි ප්‍රතිපාදන අනුව කටයුතු කළ යුතුවේ. | මෙම විගණන විමසුම් සඳහා දැනට පිළිතුරු සකස් කරමින් පවතින අතර ඉදිරියේදී පිළිතුරු ලබාදීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරික්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට තනතුරු 13 ක කාර්ය මණ්ඩල පුරප්පාඩු 52 ක් පැවතුණු අතර තනතුරු 05 ක 17 දෙනෙකුගේ අතිරික්තතාවයක් පැවතුණි. එමෙන්ම කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවක සංඛ්‍යාව 05 ක් ද විය. | කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හා අනුමත කාර්යමණ්ඩලයට ඇතුලත් අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂයේදී තනතුරු 13 ක පැවති පුරප්පාඩු අතරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 02 ක් 2019 වර්ෂය තුළ සම්පූර්ණ වූ අතර ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු අතරින් රියදුරු පුරප්පාඩු 04 ක් සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අනුමැතිය මත සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. ඒ අනුව ඉදිරියේදී බඳවා ගැනීමට කටයුතු සිදු කරනු ඇත. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයන් වෙනුවට ස්ථිර සේවකයන් බඳවා ගැනීමක් සිදු නොවුණි. |